## සාරාංශය

ප්‍රාථමික අධ්‍යාපනය විධිමත් අධ්‍යාපන ක්‍රියාවලියේ පදනම වෙයි. ප්‍රාථමික අධ්‍යාපනයේ ප්‍රධාන අරමුණ වනුයේ සියලුම දරුවනට ප්‍රශස්ත ඉගෙනුම් ප්‍රතිඵල ලබාදීමයි. ඒ අනුව ප්‍රාථමික අධ්‍යාපනයේ දෙවන ප්‍රධාන අවධියේ 4 වන ශ්‍රේණියේ මව්බස ලිවීමේ කුසලතා විෂයෙහි සාධන මට්ටම් සහ ඒ කෙරෙහි බල පා ඇති සාධක පිළිබඳව සොයා බැලීම සඳහා මෙම අධ්‍යනය මෙහෙය වන ලදි.

ප්‍රාථමික අධ්‍යාපනය නිසිලෙස නොලැබීමෙන් අනෙකුත් අධ්‍යාපන අවස්ථා පසුකර යාමට නොලැබේ. ඒ අනුව ප්‍රාථමික අධ්‍යාපනය ඉහළ අධ්‍යාපනයක් ලැබීමේ මූලාරම්භය ලෙස සැලකේ. මේ තත්වය අවබෝධ කරගත් ලෝකයේ බොහෝ රටවල් ප්‍රාථමික අධ්‍යාපනයේ සංවර්ධනය සඳහා විශාල දායකත්වයක් ලබාදෙමින් අවශ්‍ය සංවර්ධනාත්මක කටයුතු කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වමින් ඊට අවශ්‍ය සැලසුම් ක්‍රියාත්මක කර තිබේ.

ඒ අනුව අධ්‍යාපනයේ ඉදිරි සංවර්ධනාත්මක කටයුතු සඳහා අවශ්‍ය දේශීය මෙන්ම විදේශීයවද කරන ලද අධ්‍යාපන පර්යේෂණයන් විශාල සංඛ්‍යාවක් කර තිබේ. එම අ්‍යාපන මගින් අධ්‍යාපනයේ ගුණාත්මක භාවයට බලපාන විවිධාකාර වූ සාධක කෙරෙහි අවධානය යොමුකරමින් ඊට අදාල පර්යේෂණ සාහිත්‍ය ඉදිරිපත් කර තිබේ. ඒ අනුව අරමුණු පහක් ඔස්සේ මෙම පර්යේෂණ කාර්යය ගොනුකර ඇත. අවම ලකුණු ලැබූ සිසුන් පිළිබඳ විමසා බැලීම, ඔවුන්ගේ සමාජ ආර්ථික වටපිටාව, පාසල් වර්ගය, ස්ත්‍රී පුරුෂ භාවය, සාධනය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳව විමර්ශනයට ලක්කර් ඇත.

මෙම පර්යේෂණ කාර්යය සඳහා බස්නාහිර පළාතේ පිළියන්දල අධ්‍යාපන කලාපයේ 1 AB, 1 C , 2 හා 3 වර්ගයේ පාසල් 08 කින් සිසුන් 240 ක නියැදියක් තෝරා ගන්නා ලදි. මෙහිදී නියැදියට අයත් සිසුන් සඳහා ප්‍රශ්නාවලියක් සහ සාධන පරීක්ෂණයක් පවත්වා පර්යේෂණයට අවශ්‍ය තොරතුරු ලබාගන්නා ලදි. මීට අමතරව පාසල් වර්ග හතරෙන් දෙමව්පියන් 40 දෙනෙකුගේ නියැදියක් තෝරාගත් අතර අධ්‍යයනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය වන ප්‍රශ්නාවලියක් ලබා දී අවශ්‍ය තොරතුරු ලබා ගන්නා ලදි. නියැදිය සඳහා තෝරාගත් පාසල් 08 තුළ නියමිත ප්‍රාප්ති මට්ටමට ළඟා නොවූ සිසුන් පිළිබඳව විමසා බැලීම සඳහා පන්තිභාර ගුරුභවතුන් 16 දෙනෙකුගෙන් සමන්විත නියැදියක් තෝරාගත් අතර ඔවුනට සම්මුඛ සාකච්ඡා සැලසුමක් ලබාදී අවශ්‍ය තොරතුරු ලබාගන්නා ලදි.

පර්යේෂණ කාර්යයේදී දත්ත විශ්ලේෂණය සඳහා සංඛ්‍යාත්මක වගු , ප්‍රතිශත, තීර ප්‍රස්තාර යොදාගත් අතර විස්තරාත්මක අධ්‍යයන ක්‍රමය භාවිතකර විශ්ලේෂණය කරන ලදි.

මෙම පර්යේෂණය මගින් හෙළි වූ කරුණක් වූයේ අවම ලකුණු ලබාගත් සිසුන් පාසලට පැමිණීමට ගතවන කාලය, දිනපතා පාසල් පැමිණීම, නිවසේදී පාඩම් වැඩ කියාදෙන ආකාරය ඉගෙනීමට බැහැර කාලය යෙදවීම රූපවාහිනිය නැරඹීම සඳහා ගතකරන කාලය, ඉගෙනීමට දක්වන රුචිකත්වය දෙමව්පියන්ගේ අධ්‍යාපන මට්ටම හා රැකියා තත්වය, ආර්ථික තත්වය සිසුන්ගේ අධ්‍යාපනයේ ප්‍රාප්ති මට්ටම පහළ යාමට හේතුවක් වී ඇතිබවයි.

ප්‍රාප්ති මට්ටම් කෙරෙහි පාසල් වර්ගයේ බලපෑම පිළිබඳ විමසීමේදී 1 AB පාසල් වර්ගයට සාපේක්ෂ 1 C , 2 හා 3 වර්ගයේ පාසල්වල ප්‍රාප්ති මට්ටම අඩුබව පැහැදිලිය. නමුත් එය විශාල වෙනසකට ලක්වී නොමැති අතර සමස්තයක් ලෙස ගත් පාසල් වර්ග හතරේම සිසුන් දුර්වල මට්ටමක පැවැති බව නිගමනය කළ හැකි විය.

මෙම පර්යේෂණය මගින් සිදුකරන ලද සිසුන්ගේ සමාජ ආර්ථික මට්ටම් පිළිබඳව විමසීමේදී සිසුන්ගේ අධ්‍යාපන සාධනය කෙරෙහි සමාජ ආර්ථික තත්වය බලපා ඇති බව අවධාරණය විය. අවම ලකුණු ලබා ගත් සිසුන්ගේ නිවෙස්වල භෞතික සම්පත් අවම වීම සහ දෙමව්පියන්ගේ අඩු ආදායම් තත්වය සිසුන්ගේ ප්‍රාප්ති මට්ටම කෙරෙහි බලපා ඇති බව හෙළිවිය. පවතින සමාජ වටපිටාව නාගරික අර්ධ නාගරික තුළ ව්‍යාප්ත වීම නිසා දෙමව්පියන්ගේ පහළ අධ්‍යාපන තත්වයද සිසුන්ගේ ප්‍රාප්ති මට්ටම් කෙරෙහි බලපා ඇතිබව නිගමනය විය.

මීට අමතරව ප්‍රාප්ති මට්ටම් කෙරෙහි ස්ත්‍රී පුරුෂභාවය බලපානවාද යන්න විමසීමේදී පර්යේෂණයෙන් හෙළිවූයේ ශිෂ්‍ය සාධනය කෙරෙහි ස්ත්‍රී පුරුෂ භේදයක් බල නොපාන බවයි. ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සාධනය අවම මට්ටමක පැවති බව නිගමනය වී ඇත

කරන ලද පර්යේෂණයෙන් හෙළි වූ කරුණු පදනම් කරගෙන ඉදිරියේදී ගත යුතු ක්‍රියාමාර්ග යෝජනා කර ඇත.